45

Article 11
Article 13(2)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2018.03.28.

| | | |
|---|---|---|
| පැමිණිලිකරු | : | කේ.කේ රණසිංහ මයා,<br>63/1, සපුගහවත්ත,<br>නෙරලම්පිටිය, මුලටියන. |
| වගඋත්තරකරුවන් | : | 01 උ.පො.ප රුක්මන් මයා,<br>පොලිස් ස්ථානය,<br>හක්මණ. |
| | | 02 පො.සැ දයාපාල මයා,<br>පොලිස් ස්ථානය,<br>හක්මණ. |
| | | 03 පො.කො 55945 චන්දන මයා,<br>පොලිස් ස්ථානය,<br>හක්මණ. |
| | | 04 පො.කො 56418 දිසානායක මයා,<br>පොලිස් ස්ථානය,<br>හක්මණ. |
| | | 05 පොලිස් ආරක්ෂක සහයක 30 විජේසිංහ මයා,<br>පොලිස් ස්ථානය - හක්මණ. |

<u>පැමිණිලි අංකය</u> : **HRC/MT/08/09**

පැමිණිල්ල :-

01. උක්ත පැමිණිලිකරු 2009.02.02 දින මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති අතර රඳාවෙල පොලිස් මුරපොළේ සේවයේ යෙදී සිටි නිලධාරීන් විසින් 2008.12.30 දින අත්අඩංගුවට ගෙන හක්මන පොලිස් ස්ථානයේදී පහරදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳව මෙම පැමිණිල්ල ගොනුකර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලිකරුගේ ප්‍රකාශය ඃ-

02. පැමිණිලිකරුගේ ප්‍රකාශය පරිදි 2008.12.30 දින තමන් ට්‍රැක්ටර් රියදුරෙකු ලෙස සේවය කරන රඳාවෙල වික්‍රම හාඩ්වෙයාර් අසලදී නිල ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරීන් දෙදෙනකු උදේ 10.30 පමණ අත්අඩංගුවට ගෙන පහරදී එම ස්ථානයේ සිට මීටර් 150 ක් පමණ දුරින් පිහිටි රඳාවෙල හන්දියේ ඇති පොලිස් මුරපොළ වෙත ගෙනගොස් පැය 3 ක් පමණ එහි රඳවා තබාගෙන ඇත. පසුව දහවල් 1.30 ට පමණ හක්මන පොලිස් ස්ථානයෙන් පැමිණි ජීප් රථයෙන් හක්මන පොලිස් ස්ථානය වෙත ගොස් ගොස් පොලිස් සිර මැදිරියට දමා ඇති අතර සවස 2.30 ට පමණ පොලිස් ස්ථානයේ උඩු මහලේ කාමරයකට ගෙන ගොස් බිම දිගා කර අත්දෙක ඉදිරියට දිගු කර සිටියදී එක් නිලධාරියෙකු එම දිගු කර සිටි අත්දෙක එක කකුලකින්ද අනෙක් කකුල ඔළුව උඩ තබාගෙන පාගාගෙන සිටින විට තවත් නිලධාරියෙකු යටි පතුල් වලට පොලු පහර 20 ක් පමණ ගසා ඇත. එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ දකුණු කකුල ඉදිමී ඇති අතර, එසේ පහරදෙන අතර "උඹ කියපන් සනත් කිව්වා අපි පොලීසියට ගොස් ගහමු කියලා එතකොට ගිහින් ගැහුවා කියපන් කියලා" කියමින් පහරදී ඇත. එවිට කකුල් දෙකේ දැඩි වේදනාවක් ඇති වූ බවත් "බුදු මහත්තයෝ ගහන්න එපා" යනුවෙන් තමා වදින විට "පොලිස්කාරයෝ කොහෙද යකෝ බුදු වෙන්නේ" කියමින් නැවත නැවත යටිපතුල් වලට පහරදුන් බවත් පො.කො 56418 දිසානායක නිලධාරියා කණ්දෙක අල්ලාගෙන කාමරය වටේ රවුමට පැන පැන යන ලෙස කියා ඇත. ඉන්පසු පැමිණිලිකරු හට නැඟී සිට කණ් දෙක අල්ලාගෙන වට 10 ක් දුවන ලෙස දැන්වූ බවත්, පසුව පහරදීම නවතා නැවත සිර කුඩුවට දැමූ බවත් කියා ඇත.

03. පසුව සිර මැදිරියේදී සිටියදී තමාට පහරදීම සිදුකළ නිලධාරීන් උ.පො.ප රැක්මන් හා දයාපාල සාජන් මහතා බවට හඳුනාගත් බවත් ප්‍රකාශ කර ඇත. ඉන් පසු 2008.12.30 රාත්‍රියේදී සිරමැදිරියේ රඳවා තබා තිබූ බවත් පසුදින එළියට ගෙන දයාපාල සාජන් මහතා විසින් ප්‍රකාශ ගැනීමට පැමිණිලිකරුගේ නම, ගම, වයස විමසා ඇති අතර, එහිදීද පොලිස් සැරයන් දයාපාල විසින් පැමිණිලිකරුගේ කණට පහරදී ඇති බව දක්වයි.

04. අදාළ ප්‍රකාශ ලබා ගැනීමෙන් පසුව 2008.12.31 දින දයාපාල සාජන් මහතා පදවන ලද පොලිස් ජීප් රථයෙන් පැමිණිලිකරුව ගංගොඩගම රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර එම අවස්ථාවේදී පැමිණිලිකරු විසින් පොලිස් නිලධාරීන් පහරදුන් බවට වෛද්‍යවරයා වෙත ප්‍රකාශ කළද කිසිදු පරීක්ෂාවකින් තොරව පොලිස් නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයකට අත්සන් යෙදූ බවද සඳහන් කර ඇත.

05. ඉන්අනතුරුව එදිනම, එනම් 2008.12.31 දින එම ජීප් රථයෙන්ම මාතර මහේස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ආ බවද ජීප් රථයෙන් බිමට බැසීමට අපහසු බැවින් තමන් සමඟ ජීප් රථයෙන් ගෙන එනු ලැබූ තවත් සැකකරුවෙකු වූ රඳාවෙල කිත්සිරිපුර කඩුකන්නේ ගෙදර එස්. චමින්ද සුදර්ශන යන අයගේ සහයෙන් අධිකරණය තුළට ගිය බවද, අධිකරණය මඟින් තමා වෙත ඇප ලබා දුන් බවද දක්වා ඇත. පසුව එදිනම කඹුරුපිටිය ආදාපාන රෝහලට ඇතුළත් වීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා මාතර මූලික රෝහලට මාරුකර එවූ බවද දක්වා ඇත. එහිදී වෛද්‍යවරයා විසින් තමාව පරීක්ෂා කිරීමෙන් පසු තමාගේ කකුල කැඩී ඇති බවට නිගමනය කර බැන්ඩේජ් (POP) යොදන ලද බවත්, ඒ අනුව තමාට දින ගණනාවක් නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවූ අතර, මෙලෙස කකුල කැඩී ආබාධිත තත්වයට පත්වූයේ ඉහත වගඋත්තරකාර උ.පො.ප රුක්මාන් නිලධාරියා විසින් සිදුකරන ලද පහරදීම හේතුවෙන් වන බවත් වැඩිදුරටත් සිය පැමිණිල්ල මගින් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් ඃ-

06. වගඋත්තරකාර පො.කො 55945 චන්දන නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයන්ට අනුව 2008.12.30 දින පැය 14.00 සිට පැය 22.00 දක්වා හක්මන රඳාවෙල මාර්ග බාධක රාජකාරියේ නියැලෙමින් සිටියදී 2008.12.12 දින පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කර පොලිස් නිලධාරීන්ට පහරදීම සඳහා පැමිණි කණ්ඩායමේ සිටි නෙරලම්පිටිය ට්‍රැක්ටර් කපිල යන පැමිණිලිකරු එකී චෝදනාව සඳහා 2008.12.30 දින පැය 14.30 ට පො.කො 56418 දිසානායක නිලධාරියා විසින්ද, එම වරදටම චමින්ද සුදර්ශන යන අයද තමන් විසින් අත්අඩංගුවට ගත් බවට දක්වා ඇත.

07. පො.කො 56418 දිසානායක යන වගඋත්තරකරු විසින් ලබා දී ඇති ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ, 2008.12.30 පැය 14.00 සිට පැය 22.00 දක්වා හක්මන මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටියදී ඉහත දක්වන ලද චෝදනාවට අදාළව චමින්ද සුදර්ශන යන සැකකරු පැය 14.00 ට පො.කො 55945 චන්දන හා පොලිස් ආරක්ෂක සහයක 30 විජේසිංහ යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලද බවයි. ඉන් පසු තමන් විසින් පෞද්ගලික ත්‍රීරෝද රථයකින් ගෙනගොස් පොලීසියට භාරදුන් බවත් ඒ අවස්ථාවේදී පිටතින් පෙනීමට තුවාල කිසිවක් නොතිබූ බවත් දක්වා ඇත.

08. පොලිස් ආරක්ෂක සහයක 30 විජේසිංහ යන අය විසින් ලබා දී ඇති ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ, තමා 2008.10.30 දින පැය 14.00 සිට පැය 22.00 දක්වා රඳාවෙල මාර්ග බාධකයේ රාජකාරී කරමින් සිටි බවත් කපිල රණසිංහ හා චමින්ද සුදර්ශන යන අය ඉහත චෝදනාවන් සඳහා 2008.12.30 පැය 14.35 ත් පැය 15 ත් අතර රඳාවෙල හංදියේදී පො.කො. 56418 දිසානායක විසින් අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කළ බවද, අත්අඩංගුවට ගැනීමේදී අවම බලය පාවිච්චි කිරීමක් හෝ පහරදීමක් සිදු නොකළ බවද වේ.

09. මෙහි පළවන වගඋත්තරකාර හක්මන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වන උ.පො.ප රුක්මන් යන අය විසින් ලබා දී ඇති ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ, තමන්ට විරුද්ධව මෙම පැමිණිල්ල කර ඇති බව දැනගැනීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සොයා බැලූ බවත්, ඒ අනුව පොලිස් ස්ථානයේ MOIB 78/152 යටතේ පැය 16.55 ට කපිල කුමාර රණසිංහ පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම 402/08 යටතේ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර අනතුරුව අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, මෙම පැමිණිලිකරු කියා සිටින පරිදි පහරදීමක් සිදු නොකළ බැවින් එම චෝදනා ප්‍රතික්ෂේප කරන බවයි. එසේම තමන් විසින් පහරදුන්නේ නම් මහේස්ත්‍රාත්තුමා වෙත සහ වෛද්‍යවරයා වෙත පැමිණිලි කළ යුතුව තිබුනද පැමිණිලිකරු එසේ කටයුතු කර නොමැති අතර, මොහු පිළිබඳව සොයා බැලීමේදී උපතින්ම කකුලේ ආබාධයක් ඇතිවීම නිසා වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්නා අයකු බවට කරුණු අනාවරණය වූ බවත්, එමෙන්ම ඔස්ටියෝ පොරෝසිස් රෝගයටද මොහු කළක පටන් ප්‍රතිකාර ගනු ලබන බවට තොරතුරු ලැබී ඇති බවත් සඳහන් කර ඇත. එසේම මෙම සිදුවීම සිදු වූ 2008.12.30 දින උදේ 8.45 ට පමණ ස්ථානාධිපතිතුමා සමඟ සිවිල් ආරක්ෂක කමිටු රැස්වීම් කිහිපයක් සඳහා සහභාගී වීමට ස්ථානයෙන් පිටව ගොස් නැවත ස්ථානයට පැමිණිලියේ ප.ව 6.30 ට පමණ බවත් කියා ඇත.

පැමිණිල්ල සනාථ කිරීම ඃ-

10. පැමිණිලිකරුට අදාළව මාතර මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් සපයා ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකාර කපිල කුමාර රණසිංහ යන අය 2008.12.31 වන දින රෝහල්ගතව 2009.01.08 දින දක්වා ප්‍රතිකාර ලබා ගෙන ඇති බවට දක්වා ඇත.

11. එසේම රෝගියා විසින් දෙන ලද කෙටි රෝග ඉතිහාසයට අනුව, හක්මන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් රඳාවෙලදී තමාව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයේදී රුක්මන් හා දයාපාල යන නිලධාරීන් ප.ව 2.30 ට පමණ මුහුණ පිටුපසට වන සේ බිම දිගාකර පාද දෙකේ යටිපතුල් වලට පහරදුන් බවත්, තමා පොලිස් අත්අඩංගුවට ගනු ලැබුවේ පෙ.ව 10.30 ට පමණ බවත් දක්වා ඇත. [Assaulted by police officers of police station Hakmana, (Rukman And Dayapala) on 30/12/2008 at 2.30PM at the police station of Hakmana. He was kept on prone position and assaulted to the both soles. He was arrested at 10.30 AM at Radawela]

12. එසේම පැමිණිලිකරුගේ දකුණු පතුලේ සුලගිල්ල සම්බන්ධ කරන අස්ථිය කැඩී ඇති බවත් එකී තුවාලය මොට බලයක් යෙදීම මඟින් සිදුකරන ලද බරපතල ගණයේ තුවාලයක් බවත් දක්වා ඇත. (Fractured fifth metatarsal bone of the right foot)

13. මූලටියන, නෙරලම්පිටිය, සපුගස්වත්ත හි යූ.ජී ඉනෝකා යන අය විසින්ද (අගතියට පත් අයගේ බිරිඳ) 2009.08.21 මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශයට අනුව 2008.12.30 වන දින හක්මන පොලිස් ස්ථානය මඟින් පැමිණිලිකාර කපිල කුමාර යන අය අත්අඩංගුවට ගත් බවට දැනගත් පසු එදින පොලිස් ස්ථානයට ගොස් පැමිණිලිකරුට දිවා ආහාරය ලබා දුන් බවත්, පසුව රාත්‍රියේ දරුවන් සමඟ පොලිස් ස්ථානයට ගියද පැමිණිලිකරු බැලීමට ඉඩ ලබා නොදී පසුදින පැමිණෙන ලෙසට දැනුම් දුන් බවත්ය. ඒ අනුව තමා පසුදින එහි ගිය විට පැමිණිලිකරු කකුල් බිම තැබීමට නොහැකිව සිටි බවත්, අත්දෙකේ ඇඟිලි ඉදිමීම නිසා උදෑසන ආහාරය ගැනීමටද නොහැකිව සිටි බවත් දන්වා ඇත.

14. පසුව අධිකරණයට යන ලෙසට පොලිස් නිලධාරීන් ලබා දුන් උපදෙස් පරිදි මාතර අධිකරණයට යාමෙන් පසු පොලීසිය විසින් පැමිණිලිකරු ජීප් රථයෙන් රැගෙන ආවද ඔහුට ඉන් බැස ගැනීමට හා ඇවිද ගැනීමට නොහැකිව සිටි බවත්, පසුව ඔහු සමඟ රැගෙන ආ චමින්ද යන සැකකරුගේ සහයෙන් උසාවියට ගෙන ගිය බවත්, පොලිස් නිලධාරීන් පහරදුන් බවට මහේස්ත්‍රාත්වරයාට පැමිණිලි කළහොත් ඇප ලබා ගැනීම අපහසු විය හැකි බවට නීතිඥ මහතා ලබා දුන් උපදෙස් අනුව පහරදීම පිළිබඳව මහේස්ත්‍රාත්තුමාට හෙළි නොකළ බවත්, එම අවස්ථාවේදීම පැමිණිලිකරු ඇප මත මුදා හළ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

15. තවද පැමිණිලිකරු සමඟ අත්අඩංගුවට ගෙන ඇති චමින්ද සුදර්ශන සේනානායක යන අය විසින් 2010.11.08 වන දින මෙම පැමිණිල්ලට අදාළව සාක්ෂි ලෙස කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශයක් දී ඇති අතර, 2018.12.12 දින සිදුවූ මුල් සිද්ධියට දින 20 කට පමණ පසු එනම් 2008.12.30 දින රදාවෙල මුරපොළට භාරවුනු බවත්, මුරපොළට ගිය ත්‍රීවිල් එකෙන් තිහගොඩ වැඩකරන රාළහාමි කෙනකු සමඟ පොලිස් ස්ථානයට ගෙන ගොස් භාරදුන් බවත් පොලිස් සිර මැදිරියේ තමන් හා පැමිණිලිකරු වෙන් වෙන් සිරමැදිරි වල රඳවා ගෙන සිටි බවත් 2008.12.31 දින අධිකරණය වෙත එකම ජීප් රථයකින් රැගෙන ගිය බවත් පැමිණිලිකරු ඇවිදීමේ අපහසුතාවයකින් සිටි හෙයින් තමා විසින් පැමිණිලිකරුව වත්තන් කරගෙන අධිකරණය වෙත ගෙන ගිය බවත් කියා ඇත.

කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු ඃ-

16. 2008.12.12 වන දින හක්මණ රඳාවෙල මාර්ග බාධකයේ රාජකාරියේ යෙදී සිටි නිලධාරීන් හට පහරදී රාජකාරියට බාධා කිරීම පිළිබඳ පැමිණිලිකරුගේ සහෝදරයෙකු හට විරුද්ධව චෝදනා කර අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරුද එකී චෝදනාව නඟමින් 2008.12.30 දින අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇති අතර බී.ආර් 3198/08 අංකය යටතේ 2008.12.31 දින දී අධිකරණයට ඉදිරිපත් කර ඇප මත මුදාහැර ඇත.

17. 2008.12.30 දින අත්අඩංගුවට ගැනීමෙන් පසු පැමිණිලිකරු හක්මන පොලිස් ස්ථානයේ උඩුමහලේ කාමරයකට රැගෙන ගොස් මුනින් අතට අත් ඉදිරියට දිගුකරගෙන සිටින සේ බිම දිගාකර එක් නිලධාරියෙකු විසින් එක කකුලකින් අතද අනෙක් කකුලකින් හිසද පාගාගෙන සිටින විටදී තවත් නිලධාරියෙකු පොල්ලකින් පැමිණිලිකරුගේ යටිපතුල් වලට 20වරක් පමණ පහරදී ඇත. පසුව පැමිණිලිකරු විසින් ඔහුට පහරදුන් නිලධාරියා උ.පො.ප රුක්මන් ලෙසටද අත් හා ඔළුව පාගාගෙන සිටි නිලධාරියා පො.සැ 55811 දයාපාල ලෙසටද හඳුනාගෙන ඇත.

18. පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පිටතින් පෙනීමට තුවාල නොමැති බව අත්අඩංගුවට ගත් 03, 04, 05 වගඋත්තරකරුවන් විසින් සටහන් යොදා ඇති අතර හක්මන පොලිස් ස්ථානයේ සුළු අපරාධ සටහන් පොතේ පිටු අංක 78 ඡේදය 158 යටතේ පැමිණිලිකරු පැය 16.55 ට උපසේවයට භාරදෙන අවස්ථාවේදී පිටතින් පෙනීමට තුවාල කිසිවක් නොමැති බවත් උපසේවක සටහන් යොදා ඇත.

19. 2008.12.31 දින පිටු අංක 89 ඡේදය 166 පරිදි ප.ව 12.00 ට පැමිණිලිකරු සහ චමින්ද සුදර්ශන යන දෙදෙනා මාතර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගොස් ඇති අතර පැමිණිලිකරු හට ඇවිද යාමේ අපහසුවක් පැවැති හෙයින් චමින්ද සුදර්ශන යන අය පැමිණිලිකරු වත්තන් කරගෙන අධිකරණය තුළට ගෙන ගොස් ඇත.

20. වෛද්‍ය වාර්තා අනුව පැමිණිලිකරුගේ දකුණු පතුලේ මොට බලය යෙදීමකින් සිදුව ඇති අස්ථි බිඳීමක් සිදුවී ඇත. ඒ අනුව පෙනී යන්නේ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව හක්මණ පොලිස් ස්ථානයට භාර දුන් අවස්ථාව හා පැමිණිලිකරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති කාලසීමාව තුළදී පොලිස් භාරයේ සිටියදී පැමිණිලිකරුහට පහරදීමක් සිදුවී ඇති බව වේ.

21. අදාළ පහරදීම සම්බන්ධයෙන් 01 වන වගඋත්තරකාර උ.පො.ප රුක්මන් යන අය ප්‍රකාශ කරන්නේ පැමිණිලිකරු කුඩාකළ සිට "ඔස්ටියෝ පොරෝසිස්" රෝග තත්වයෙන් පෙළෙන අයකු බවයි. එසේම 2008.12.31 දින පැය 12.00 ට හක්මන පොලිස් ස්ථානයේ MOIB පොතේ 89 පිටුවේ 166 ඡේදය පරිදි පැමිණිලිකරු අධිකරණ වෛද්‍ය පෝරම 402/08 සමඟ ගංගොඩගම රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර ඇති අතර එහි තුවාල කිසිවක් නොමැති බව දක්වා තිබීම සහ පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කළ පසු අධිකරණයට පහරදීම පිළිබඳව දැනුම් දී නොතිබීමත්, එසේම එදින 2008.12.30 උදේ 8.45 ට පමණ ස්ථානාධිපතිතුමා සමඟ ස්ථානයෙන් පිටව ගොස් නැවත ස්ථානයට පැමිණියේ එදින ප.ව 6.30 ට බවට කරුණු ඉදිරිපත් කරමින් 01 වන වගඋත්තරකරු විසින් අදාළ පහරදීම ප්‍රතික්ෂේප කර ඇත. නමුත් එකී ස්ථානයෙන් බැහැරවීම පිළිබඳව සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට දැනුම් දුන්නද එවැන්නක් ඉදිරිපත් කිරීම මඟහැර ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව 01 වන වගඋත්තරකරු විසින් තමා එම පහරදීම සම්බන්ධ නොවූ බවට ඉදිරිපත් කර ඇති කරුණු කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කර සිටී.

22. පැමිණිලිකරු 2008.12.31 දින රෝහල් ගතව ප්‍රතිකාර ලබා ඇත්තේ ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 311 යටතේ ගැනෙන ශරීරයේ ඇටයක් හෝ දතක් අවසන්දි කිරීම හෝ කැඩීම යන ගණයට ඇතුළත් කාරණයක් සම්බන්ධයෙන් වන අතරම, එය බරපතල තුවාල ගණයට හා මොට ආයුධ මඟින් සිදුවූවක් බවට මාතර රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් සපයා ඇති වෛද්‍ය වාර්තාවෙන් සනාථ වේ.

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන මූලික අයිතිවාසිකම, 01 සහ 2 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව තීරණය කර සිටී.

23. එසේම 03, 04, 05 වගඋත්තරකරුවන් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශ සහ පොලිස් ස්ථානයේ යොදා ඇති සටහන් අනුව 2008.12.30 දින පැය 14.00 සිට පැය 22.00 දක්වා රඳාවෙල මාර්ග බාධකයේ සේවය කර ඇති බවත් එදින පැය 14.30 ට පමණ පැමිණිලිකරු අත්අඩංගුවට ගත් බවත් පැය 16.55 ට හක්මන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇති බවත් පිළිගනී. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු පැය 02 කට වඩා වැඩි කාලයක් පොලිස් මුරපොළේ රඳවාගෙන සිටීම පිළිබඳව 03, 04, 05 වගඋත්තරකරුවන් වගකීමෙන් බැඳෙන බව කොමිෂන් සභාව තීරණය කර සිටී. එකී ක්‍රියාව නීතියේ නියමකර ඇති ආකාරයට පරිබාහිරව රඳවාතබා ගැනීමක් වන අතර, ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (2) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් කඩ කිරීමක් සිදුවී ඇති බව කොමිෂන් සභාව තීරණය කර සිටී.

, 13(2)

ඒ අනුව එකී කඩ කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන සහන පැමිණිලිකරු වෙත ලබාදිය යුතු බවට නිර්දේශ කර සිටී.

නිර්දේශය :-

01. පළවන හා දෙවන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට රු. 50,000/- බැගින් වූ වන්දි මුදලක් ගෙවිය යුතුය.

02. 03, 04 වන සහ 05 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත රු. 5,000/- ක් බැගින් වන්දි මුදලක් ගෙවිය යුතුය.

03. 1994 අංක 22 දරණ වධහිංසාවට එරෙහි සම්මුති පනත යටතේද පොලිස් දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියාපටිපාටිය යටතේද අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා මෙහි පිටපත් පොලිස්පතිවරයා වෙතද නීතිපතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2018.04.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත : ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරි,
මානව හිමිකම් කොමිෂන් සභාව, මාතර.

B/